# ප්‍රතිසංස්කරණවාදීන්ගේ ක්‍රිස්තියානිය

කතෝලික ආගම පළමු සියවස් තුනේ එතරම් ව්‍යාප්ත නොවුණ ද ඒ කාලයෙහි එහි පදනම යම් ප්‍රමාණයකට වුව ද සකස් විණි. ප්‍රථම පාප් වහන්සේ ලෙස සැලකෙන ශාන්ත පීතර තුමා පාවුළු තුමා සමග රෝමයේ වාසය කිරීම රෝමයේ පූජකවරුන්ට ප්‍රධාන තැන ලැබීමට හේතුවක් ලෙස සැලකෙයි. එහෙත් ඒ එසේ සිදුවිණි ද එසේත් නැත්නම් රෝම අධිරාජ්‍යයේ ප්‍රධාන නගරය වූ රෝමයේ විසූ පූජකවරුන්ට ප්‍රධාන තැන ලැබුණේ ද යන්න පැහැදිලි නැත. කෙසේ වෙතත් ක්‍රිස්තුවර්ෂ 58 වන විට (එනම් අද ක්‍රිස්තුවර්ෂ 58 නමින් හැඳින්වෙන වසර වන විට) රෝමයේ ක්‍රිස්තියානි (කතෝලික) භක්තියන් යම් ප්‍රමාණයක් විසූ බව හෙළි වෙයි.

ක්‍රිස්තියානි හෙවත් කතෝලික ආගම යැයි පසුව හඳුන්වනු ලැබූ ආගම මුල දී ද වැඩි වශයෙන් ප්‍රචාරය වූයේ යුදෙව් නොවන ගෝත්‍ර හා ජනතාව අතර ය. මුල් ආගම ක්‍රිස්තියානි ආගම යනුවෙන් හැඳින්වෙන්නට ඇත. ක්‍රිස්තුස් වහන්සේ දෙසූ ආගම ක්‍රිස්තියානි නමින් හැඳින්වීම ස්වාභාවික ය. ඒ කතෝලික ලෙස හඳුන්වන්නට ඇත්තේ සමස්තය වැනි කරුණු අවධානයට ලක්වීමෙන් පසුව විය හැකි ය. (අප බොහෝ විට කියා ඇති පරිදි කතෝලික යන්නෙන් සමස්තය යන්න ගම්‍ය වෙයි) කතෝලික ආගම තහවුරු වීමෙන් පසුව දහසය වැනි සියවසේ දී කතෝලික පල්ලියට එරෙහිව මාටින් ලූතර් වැන්නන් ඇරඹූ ව්‍යාපාරයෙහි අවශ්‍යතාව වූයේ නැවතත් මුල් ක්‍රිස්තියානි ආගමට යැම ය. එබැවින් ඔවුහු තම නව ආගම ක්‍රිස්තියානි ලෙස ම හැඳින්වූහ.

මේ මුල් ක්‍රිස්තියානියට ආපසු යැම යන්න තව තවත් අධ්‍යයනයට භාජනය විය යුත්තකි. එක් අතෙකින් ගත්කල අද යොදාගන්නා වචන භාවිතා කළහොත් මාටින් ලූතර් වැන්නෝ මූලධර්මවාදියෝ වූහ. බොහෝ චින්තන හා වෙනත් විප්ලව එවකට ආධිපත්‍යය දරණ මතවාදයේ අනුගාමිකයන්ට හා අනුග්‍රාහකයන්ට අනුව මූලධර්මවාදී වෙයි. මාක්ස්වාදයේ ද ආපසු මාක්ස්ට (back to Marx) ආදී ව්‍යාපාර අද ද වෙයි. එහෙත් මේ කිසිවකුට හෝ කිසිම ව්‍යාපාරයකට හෝ ආපසු මුල් දහමට, කෘතියට යා නො හැකි ය. සෑම ඉගැන්වීමක් ම විකාශයෙහි දී යම් යම් කරුණු එකතු කරගන්නා අතර වෙනත් කරුණු ඉවත් කරයි. ඒ සියල්ල නැවතත් තිබූ අයුරින්ම පවත්වාගෙන යෑමට සමාජ විකාශය විසින් ඉඩ දෙනු නො ලැබෙයි. මාටින් ලූතර් වැන්නන්ට ද කිසි දිනෙක නැවතත් ක්‍රිස්තුස් වහන්සේ කරා යෑමට නො හැකි විය.

එහෙත් ඔවුන්ට අවශ්‍ය වූයේ කුමක් ද යන්න තේරුම් ගැනීමෙන් අපට මුල් ක්‍රිස්තියානිය කුමක් ද යන්න පිළිබඳ හෝඩුවාවක් ලබාගත හැකි ය. මෙහි දී අවධාරණය කළ යුත්ත නම් ඒ මුල් ක්‍රිස්තියානිය අප දකින්නේ ද මාටින් ලූතර් වැන්නන්ගේ ඇසින් බව ය. ක්‍රිස්තුස් වහන්සේගේ ඉගැන්වීම් කතෝලික ආගම ලෙස මෙතරම් පැතිරී යෑමට හේතු කවරේ ද යන්න අප ඇසූ මුල් ප්‍රශ්නයක් වෙයි. එයට ඉතා පහසු පිළිතුරු තිබේ. එනම් දේශපාලන ආධිපත්‍යය යෙදවීම, කුරුස යුද්ධ (crusades) ඔස්සේ ආගම ප්‍රචලිත කිරීම, සංවීක්ෂණ (inquisitions) ආදිය වෙයි. එහෙත් මේ සාධාරණ (පොදු යන අරුතින්) හේතු නො වේ. යුරෝපයේ දී මේ ක්‍රම භාවිතා වුවත් ආසියාවේ පිලිපීනයේ හැරෙන්නට මැතක් වන තුරු මේ ක්‍රමවලින් වුවත් කතෝලික හෝ වෙනත් ක්‍රිස්තියානි ආගමක් හෝ පතුරුවා හැරීමට නො හැකි විය. අද දකුණු කොරියාවේ ද වෙනත් ආසියාතික රටවල ද මූලධර්මවාදී යැයි කියන ක්‍රිස්තියානි ආගම්වලට යම් ඉඩක් සැපයී ඇත්තේ කෙසේ ද යන්න ද අප සලකා බැලිය යුතු ය.

ලෝකය පුරා පැතිරී ගියේ ක්‍රිස්තුස් වහන්සේගේ ඉගැන්වීම් ද උන්වහන්සේ ගේ නමින් ප්‍රචාරය වූ වෙනත් ඉගැන්වීම් ද යන ප්‍රශ්නය වෙයි. ක්‍රිස්තුස් වහන්සේ යුදෙව් ඉගැන්වීම්වලට පටහැණිව ගොස් ඇති බව පැහැදිලි ය. යුදෙව්වන් ඉතා විශාල බහුතරයක් උන්වහන්සේට විරුද්ධ වූයේ ද අවසානයේ දී රෝම ආණ්ඩුකාරයා ලවා උන්වහන්සේට මරණ දඬුවම පමුණුවනු ලැබුයේ ද එබැවිනි. උන්වහන්සේ තමන් දෙවියන් වහන්සේගේ පුත්‍රයා බව කීවේ ය. ඒ කියමන යුදෙව්වන් කුපිත කළ බව නිසැක ය. මාටින් ලූතර් වැන්නෝ ද ඒ නිෂ්ප්‍රභ නො කරති. එහෙත් ඔවුහු මරියතුමියට කතෝලික ආගම විසින් දෙනු ලැබ ඇති තත්වය ප්‍රතික්ෂේප කරති.

කතෝලික ආගමේ දෙවියන් වහන්සේ සංයුක්ත වෙති. කතෝලිකයෝ එකට එකතු වී තම සංයුක්ත දෙවියන් වහන්සේට පල්ලියේ දී යාඥා කරති. කතෝලික ආගමෙහි ශුද්ධ වූ ත්‍රිත්වයක් (Holy Trinity) වෙයි. ඒ දෙවියන් වහන්සේ හා

© Prof. Nalin De Silva

පීතෘ, දෙවියන් වහන්සේ හා පුත්‍රයා, ශුද්ධ වූ ආත්මය (Holy Spirit) යනුවෙනි. මේ ත්‍රිත්වය ක්‍රිස්තියානි ආගම් විසින් ප්‍රතික්ෂේප නො කෙරේ. (දෙවියන් වහන්සේ පියා ලෙස ද පුත්‍රයා ලෙස ද එක්විට පෙනී සිටියි.) එසේ නම් ක්‍රිස්තියානි ආගම් විසින් කතෝලික ආගමේ කුමක් ප්‍රතික්ෂේප කෙරෙන්නේ ද? මා තේරුම් ගන්නා ආකාරයට ක්‍රිස්තියානි ආගම් විසින් ප්‍රතික්ෂේප කෙරෙන්නේ සංයුක්ත හා සාමූහික දෙවියන් වහන්සේ ය හා සාධාරණ වශයෙන් ගත්කල සාමූහිකත්ව ය. ක්‍රිස්තියානි ආගම නැවත යන්නේ යැයි කියන්නේ වියුක්ත හා කේවල දෙවියන් වහන්සේ කෙනකු වෙත ය. මෙහි දී කේවල යන්නෙන් මා අදහස් කරන්නේ තනි තනි ව වුවත් කොතැනක දී වුවත් යාඥා කළ හැකි දෙවියන් වහන්සේ කෙනෙකි.

එසේ නම් ක්‍රිස්තුස් වහන්සේගේ දෙවියන් වහන්සේ ද එවැනි කේවල දෙවියන් වහන්සේ කෙනෙක් ද? එසේ විය යුතු ම නැත. අප නැවතත් මතක් කර ගත යුත්තේ අප මේ වියුක්ත කේවල දෙවියන් වහන්සේ දකින්නේ මාටින් ලූතර් වැන්නන්ගේ ඇස්වලින් බව ය. ඔවුන් දකින ක්‍රිස්තුස් වහන්සේගේ දෙවියන් වහන්සේ, ක්‍රිස්තුස් වහන්සේගේ දෙවියන් වහන්සේ ම විය යුතු නො වෙයි. ක්‍රිස්තුස් වහන්සේගේ දෙවියන් වහන්සේ ඇත්තේ ක්‍රිස්තුස් වහන්සේගේ රාමුවෙහි ය. මාටින් ලූතර් දකින ක්‍රිස්තුස් වයන්සේගේ දෙවියන් වහන්සේ ඇත්තේ මාටින් ලූතර්ගේ රාමුවෙහි ය. අප මේ දකින්නේ අපේ රාමුවෙහි ඇති දෙවියන් වහන්සේ බව ද අමතක නොකළ යුතු ය.

කෙසේ වෙතත් අප දකින දෙවියන් වහන්සේ අපේ රාමුවෙහි සංගත විය යුතු ය. අපේ උත්සාහය එලෙස සංගත දෙවියන් වහන්සේ කෙනකු නිර්මාණය කිරීමටත් අපේ ප්‍රශ්නවලට සංගත පිළිතුරු ලබාගැනීමටත් ය. මාටින් ලූතර් වැන්නන්ගේ ක්‍රිස්තියානි ආගම්වල මරියතුමියට ප්‍රධාන තැනක් නොදීමෙන් පෙන්නුම් කරන්නේ දෙවියන් වහන්සේගේ වියුක්ත බව වැඩිකිරීම ය. ක්‍රිස්තුස් වහන්සේගේ පියා දෙවියන් වහන්සේ බව පිළිගැනීම මාටින් ලූතර් වැන්නන්ගේ රෙපරමාදු හෙවත් ප්‍රතිසංස්කරණවාදී ක්‍රිස්තියානි ආගම්වලට ප්‍රශ්නයක් නො වේ. එහෙත් මරියතුමියට ප්‍රධාන තැනක් දීම හේතුවෙන් ක්‍රිස්තුස් වහන්සේගේ දේවත්වයට තරමක කැළලක් වන්නේ යැයි ප්‍රතිසංස්කරණවාදීන් සිතන්නට ඇත. එහෙත් ඔවුන්ට එතුමිය සහමුලින් ම අමතක කර මිනිස් ලොවට පැමිණි දෙවියන් වහන්සේ කෙනකු ගැන කතාකිරීමට ද නො හැකි ය. මේ හේතුවෙන් මරියතුමිය ක්‍රිස්තුස්වහන්සේගේ මව ලෙස පිළිගන්නා අතර එතුමියට දේවත්වයක් හෝ වෙනත් වැදගත් බවක් ආරෝපණය නොකිරීමට ප්‍රතිසංස්කරණවාදීහු බලාපොරොත්තු වූහ.

යුදෙව්වෝ වියුක්ත වූහ. එහෙත් ඔවුහු සාමූහිකත්වය අගය කළ සාමූහික ජීවිත ගත කළ අය වූහ. (මගේ පැරණි ලිපියක යුදෙව්වන් වෙන් ව ජීවත් වූ අය යැයි කියා ඇත්නම් ඒ වරදකි.) ක්‍රිස්තුස් වහන්සේ මේ සාමූහිකත්වය ප්‍රතික්ෂේප කළේ යැයි කිව නො හැකි ය. උන්වහන්සේ ද සාමූහිකත්වය අගය කළහ. උන්වහන්සේ සමාජයෙන් වෙන් ව තනිව ජීවත් වූ අයෙක් නො වූහ. උන්වහන්සේ වියුක්තය නම් ප්‍රතික්ෂේප කළහ. එහෙත් ප්‍රතිසංස්කරණවාදීහු මුල් ක්‍රිස්තියානියට ආපසු යන්නේ යැයි කියමින් සමජය එකල විකාශය වෙමින් පැවති තැනකට යෑමට උත්සාහ කළහ. ඔවුහු ක්‍රිස්තුස් වහන්සේ වෙතට යන්නේ යැයි කියමින් බොහෝ කරුණුවලින් ක්‍රිස්තුස් වහන්සේගෙන් ඉවතට ගියහ.

මේ සියළු කරුණු හේතුකොටගෙන ක්‍රිස්තුස් වහන්සේ සංයුක්ත චින්තනයක සාමූහිකත්වයට ගරු කළ අයකු ලෙස අපි හඳුනාගනිමු. යුදෙව්වන් උන්වහන්සේට විරුද්ධ වූයේ උන්වහන්සේ වියුක්තයට එරෙහි ව යෑම නිසාත් තමන් දෙවියන් වහන්සේගේ පුත්‍රයා යැයි ප්‍රකාශ කිරීම නිසාත් ය. යුදෙව්වෝ කෙතරම් වියුක්ත වූවෝ ද යතහොත් ඔවුහු දෙවියන් වහන්සේගේ පිළිම නො ඇඹූවෝ ය. මෙය ඉස්ලාම් ආගමට ද පොදු වූ කරුණක් විය. යුදෙව් හෝ ඉස්ලාම් හෝ ආගමික ස්ථානවල පිළිම චිත්‍ර ආදිය දක්නට නො ලැබේ. එහෙත් කතෝලික දේවස්ථානවල ක්‍රිස්තුස් වහන්සේගේ මෙන් ම මරියතුමියගේ ද සුරුවම් දක්නට ලැබෙයි. ක්‍රිස්තුස් වහන්සේ දෙවියන් වහන්සේ හා දෙවියන් වහන්සේගේ පුත්‍රයා වුව ද මරියතුමියගේ ද පුත්‍රයා විය. එපමණ ට දෙවියන් වහන්සේට මිනිස් ස්වභාවයක් තිබිණි. වියුක්ත දෙවියන් වහන්සේ මෙන් නොව උන්වහන්සේ එකල කාහටත් දැකගත හැකි විය. මරියතුමිය ද එසේ විය. එබැවින් ක්‍රිස්තුස් වහන්සේ දෙවියන් වහන්සේ වුව ද උන්වහන්සේගේ හා මරියතුමියගේ පිළිම ඇඹීම හා චිත්‍ර ඇඳීම ප්‍රශ්නයක් නො වී ය. ප්‍රතිසංස්කරණවාදීහු මරියතුමයට වැදගත් තැනක් නොදීමෙන් ද දෙවියන් වහන්සේ නැවත වියුක්ත කළහ.

යුදෙව්වෝ තම ආගම ව්‍යාප්ත කිරීම සඳහා උනන්දු නො වූහ. ඔවුන් අනෙක් ආගම්වලට විරුද්ධ ව ක්‍රියා කළ නමුත් අන්‍ය ආගම්වල දෙවියන් වහන්සේලාගේ හා වෙනත් අයගේ පිළිම කඩා බිඳ දැමූ නමුත් අන්‍යයන් තම ආගමට හරවා

© Prof. Nalin De Silva

ගැනීමට මහත් උත්සාහයක නො යෙදුණහ. සාමාන්‍යයෙන් යුදෙව්වකු විය හැකිවූයේ උත්පත්තියෙනි. එහෙත් ක්‍රිස්තියානි ආගමට මුල දී කිසිවකු උපතින් ම ඒ ආගමට නො ලැබුණි. එබැවින් ක්‍රිස්තුස් වහන්සේට අනන්‍යනට ඉගැන්වීමට පමණක් නොව ඔවුන් ක්‍රිස්තියානි කිරීමටත් සිදුවිය.

එහි ප්‍රතිඵලය වූයේ බොහෝ විට යුදෙව්වන් උන්වහන්සේට විරුද්ධ වූ හෙයින් යුදෙව්වන් නොවන අයට ඉගැන්වීමට සිදු වීම ය. විශේෂයෙන් ම ක්‍රිස්තුස් වහන්සේ මරණයට පත්කිරීමෙන් පසුව උන්වහන්සේගේ ආරම්භක ගෝලයන්ට මෙය බලපාන්නට ඇත. ප්‍රධාන අපොස්තුළුවරුන්ට මෙය වඩාත් ම දැනුනාට සැකයක් නැත. පීටර් තුමා හා පාවුළු තුමා බටහිර ආසියාවෙන් පැන ගොස් රෝමයේ තම ඉගැන්වීම් කටයුතු කෙළේ නම් ඒ ගැන පුදුම වන්නට දෙයක් නැත. එමෙන් ම රෝම ආණ්ඩුකාරයා වූ පිලාතේ ක්‍රිස්තුස් වහන්සේට මරණීය දණ්ඩනය නියම කෙළේ යුදෙව්වන්ගේ කීමට බවත් ක්‍රිස්තුස් වහන්සේගෙන් හෝ අපොස්තුළුවරුන්ගෙන් හෝ රෝමයට තර්ජනයක් නොවූ බව ඔහු දැන සිටි බවත් අප අමතක නොකළ යුතු ය. ඇතැම්විට පීටර් හා පාවුළු අපොස්තුළුවරුන්ට යුදෙව්වන්ගෙන් බේරී රෝමයට පළා යෑමට පිලාතේ ආණ්ඩුකාරයා ආධාර කෙළේ නම් අප එයට පුදුම විය යුතු නැත. මෑත ඉතිහාසයේ බොහෝ රටවලින් එංගලන්තයට පැමිණි හා පැමිණෙන විප්ලවවාදීන්ගෙන් (කාල් මාක්ස් ද ඇතුළු) ඒ රටට අබමල් රේණුවක ද හානියක් නොවන බව ඉංගිරිසිහු දනිති. යම් අයුරකින් ඔවුන්ගෙන් එංගලන්තයට ප්‍රශ්නයක් වේ නම් ඉංගිරිසිහු ඔවුන්ට එංගලන්තයට පැමිණීමට අවසර දෙත් ද?

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva